**ශීර්ෂය 270 - අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 270 - අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය**,** එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 26 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 මැයි 23 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්**,** වියදම්**,** වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

| ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේදයට යොමුව | ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය | මෙම වාර්තාවේ ඡේදයට යොමුව |
|---|---|---|
| 1.6.1 (ඈ) | රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශය අනුව නිලධාරීන් 08 දෙනෙකුගෙන් මාස 03 සිට වර්ෂ 03 ක කාල පරාසයක සිට හිඟහිටිව පැවති රු.1,546,553 ක් අයකර ගැනීම සඳහා ලබා දී තිබූ නිර්දේශය. | 2.5 (අ) (ii) |

| | | |
|---|---|---|
| 1.6.1.(ඊ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් රජයේ නිවාස 16ක පදිංචිව සිටින පදිංචිකරුවන්ගෙන් රු.355,782 ක හිඟ කුලී අයකර ගැනීමට ලබා දී තිබූ නිර්දේශය. | 2.5 (අ) (i) |
| 3.2.(අ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් වාහනයක් පසුගිය වර්ෂ 21කට අධික කාලයක සිට අළුත්වැඩියා සිදුකිරීම සඳහා ගරාජයකට භාරදී තිබුණත්, එය අළුත්වැඩියා කිරීමට හෝ ආපසු ලබා ගැනීම සඳහා ලබා දී තිබූ නිර්දේශය. | 3.5 (අ) |
| 3.2.(ආ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2019 වර්ෂයේ සිට ගබඩා සංකීර්ණයේ නවතා තිබූ යතුරු පැදි 43 ක් භාවිතයට යොදා ගැනීමට හෝ වෙනත් යෝග්‍ය ක්‍රියාමාර්ගයක් ගැනීම සඳහා ලබා දී තිබූ නිර්දේශය. | 3.5 (ආ) |
| 3.2. (ඇ) | සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් දෙහිඅත්තකණ්ඩිය, පදියතලාව, මහඔය, දමන, අඩ්ඩාලච්චේන සහ තිරුක්කෝවිල් ප්‍රාදේශීය ලේකම් කාර්යාල පිහිටි ඉඩම්වල වටිනාකම් තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කිරීම සඳහා ලබා දී තිබූ නිර්දේශය. | 1.6.1 (අ)(v) |
| 3.3 | අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් සද්ධාතිස්සපුර ගබඩාව 2015 සැප්තැම්බර් 21 දින සොරුන් විසින් කඩා දැමීම හේතුවෙන් සිදු වූ තක්සේරු කරන ලද පාඩුව රු.850,738ක් වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීම සඳහා ලබා දී තිබූ නිර්දේශය. | 3.6 |
| 4 | 2001 අගෝස්තු 22 දිනැති අංක 18/2001 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ප්‍රකාරව, උපරිම සේවා කාලය එකම සේවා ස්ථානයක වර්ෂ 05ක් සේවය කර ඇති සෑම නිලධාරීන්ට ස්ථාන මාරු ලබාදීම සඳහා ලබා දී තිබූ නිර්දේශය. | 5 (ඇ) |

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

**(අ) දේපල පිරියත හා උපකරණ**

දේපල පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ/ ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | සමුච්චිත මූල්‍ය නොවන වත්කම් වාර්තාවේ (SA82) ඇතුළත් මූල්‍ය නොවන වත්කම්වල ඉකුත් වර්ෂය අවසානට දක්වා | පෙන්වා දී ඇති ශේෂයන් අතර වෙනස්කම්වලට හේතුන් හඳුනාගෙන ඇති අතර. එම | මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමට පෙර වෙනස්කම් හඳුනා |

| | | | |
|---|---|---|---|
| | ඇති ශේෂය රු.3,423,420,683 ක් වුවද සමාලෝචිත වර්ෂයේ ආරම්භක දිනට ශේෂය රු.3,418,509,244 ක් ලෙස දැක්වීම හේතුවෙන් ඉකුත් වර්ෂයේ අවසන් ශේෂය සහ සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂය අතර රු.4,911,439 ක වෙනස්කමක් පැවතුණි. | ශේෂයන්ගේ ආරම්භක හා අවසන් ශේෂයන් අතර වෙනසට හේතු වී ඇත්තේ WEB INTERFACE පද්ධතිය තුල භාණ්ඩාගාරය විසින් දත්ත ඇතුලත් කිරිමේදි සිදු වූ ගැටළුවක් මත බව වාර්තා කරමි. | ගනිමින් නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ii) | සමාලෝචිත වර්ෂය ආරම්භක දිනට මූල්‍ය නොවන වත්කම් ගිණුම් සාරාංශ වාර්තාවෙහි (SA80) වත්කම් අයිතම දෙකකට අදාළ ශේෂය රු.1,884,053,167 ක් වුවද සමුච්චිත මූල්‍ය නොවන වත්කම් ගිණුම් වාර්තාවේ (SA82) තුළ එම වත්කම් අයිතම දෙකකට අදාළ ශේෂය රු.1,879,141,727 කි. ඒ අනුව, මූල්‍ය නොවන වත්කම්වල වටිනාකම් වාර්තා දෙකකින් අගයන් දෙකක් ලෙස අනාවරණය කර තිබුණි. | පෙන්වා දී ඇති ශේෂයන් අතර වෙනස්කම් වලට හේතුන් හඳුනාගෙන ඇති අතර. එම ශේෂයන්ගේ ආරම්භක හා අවසන් ශේෂයන් අතර වෙනසට හේතු වී ඇත්තේ WEB INTERFACE පද්ධතිය තුල භාණ්ඩාගාරය විසින් දත්ත ඇතුලත් කිරිමේදි සිදු වූ ගැටළුවක් මත බව වාර්තා කරමි. | මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමට පෙර වෙනස්කම් හඳුනාගනිමින් නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (iii) | මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය අනුව සමාලෝචිත වර්ෂය තුළ දී මූලධන වත්කම් අත්පත් කර ගැනීමේ වටිනාකම රු.27,942,223 ක් වුවද භාණ්ඩාගාර සටහන් අනුව (සමුච්චිත මූල්‍ය නොවන වත්කම් ගිණුම් වාර්තාව - SA82) එය රු.26,208,493 ක් වූයෙන් රු.1,733,730 ක වෙනසක් පැවතුණි. | පෙන්වා දී ඇති ශේෂයන් අතර වෙනස්කම් වලට හේතුන් හඳුනාගෙන ඇති අතර. එම ශේෂයන්ගේ ආරම්භක හා අවසන් ශේෂයන් අතර වෙනසට හේතු වී ඇත්තේ WEB INTERFACE පද්ධතිය තුල භාණ්ඩාගාරය විසින් දත්ත ඇතුලත් කිරිමේදි සිදු වූ ගැටළුවක් මත බව වාර්තා කරමි. | මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමට පෙර වෙනස්කම් හඳුනාගනිමින් නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (iv) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් කාන්තා සංවර්ධන මධ්‍යස්ථානයට සහ කළමනාකරණ පුහුණු මධ්‍යස්ථානයට අයත් ඉඩම්, ගොඩනැඟිලි සහ ඉන්වෙන්ටරි ද්‍රව්‍ය තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කර නොතිබුණි. | මේ පිළිබඳව තක්සේරු කටයුතු සිදුකර අදාල වටිනාකම් මූල්‍ය ප්‍රකාශන වල දැක්වීමට කටයුතු කරමින් පවතින බව දන්වමි. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් වත්කම් හඳුනා ගනිමින් ඒවා නිවැරදිව තක්සේරු කර මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුලත් කිරීමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (v) | දමන, අඩ්ඩාලච්චානේ, තිරුක්කෝවිල් යන ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අයත් ඉඩම් ද පදියතලාව හා දමන ප්‍රාදේශීය ලේකම් කාර්යාල දෙකට අයත් නිල නිවාස හා රජයේ නිවාස ද තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කර නොතිබුණි. | තක්සේරු කටයුතු සිදුකර මූල්‍ය ප්‍රකාශන තුලට ඇතුලත් කිරිම සම්බන්ධ දැනුවත් කිරීම් අදාල ප්‍රාදේශීය ලේකම්වරුන් හා ගණකාධිකාරිවරුන් වෙත දන්වා ඇති අතර ඉදිරි වර්ෂයේ දී මූල්‍ය ප්‍රකාශන තුල අන්තර්ගත කිරිමට කටයුතු සිදුකරන බව දන්වමි. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් වත්කම් හඳුනා ගනිමින් ඒවා නිවැරදිව තක්සේරු කර මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුලත් කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (vi) | 2017 හා 2018 වර්ෂයන්හිදී ඉදිකරන ලද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ පහළොවකට අයත් නිල සෙවණ ගොඩනැගිලි වටිනාකම රු.46,422,256ක් මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කර නොතිබුණි. | අදාල ප්‍රාදේශීය ලේකම් වරුන් හා ගණකාධිකාරිවරුන් දැනුවත් කර ඇති අතර ඉදිරි වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශන තුළට ඇතුලත් කිරිම් සිදු කරමින් පවතින බව දන්වමි. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් වත්කම් හඳුනා ගනිමින් ඒවා නිවැරදිව තක්සේරු කර මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුලත් කිරීමට කටයුතු කළ යුතු වීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 අග්‍රිම කළමනාකරණය

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ/ ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| ගම සමඟ පිළිසඳර ව්‍යාපෘතිය යටතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 12 ක ඉටුකිරීමට සැලසුම් කරන ලද ව්‍යාපෘති අතරින් ව්‍යාපෘති 658 ක් සඳහා වර්ෂය තුළ සැලසුම් කළ පරිදි භාණ්ඩාගාරය විසින් අග්‍රිම නිකුත් නොකිරිම නිසා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු රු.112,295,000 ක ප්‍රතිපාදන උපයෝජනය කිරීමට නොහැකි වී තිබුණි. | අග්‍රිම නොලැබීම මත ව්‍යාපෘති ක්‍රියාත්මක නොවීම හේතුව මත ප්‍රතිපාදන උපයෝජනය කිරිමට නොහැකි වු බව දන්වන අතර අග්‍රිම නිසි පරිදි ලැබුණේ නම් ලද ප්‍රතිපාදන පූර්ණ ලෙස උපයෝජනය කිරිමට හැකියාව තිබූ බව දන්වමි. | අග්‍රිම නිසි කළමනාකරණයක් සිදුකර නියමිත කාලය තුළ ලබාගැනීමට ක්‍රියාමාර්ග ගත යුතු වීම. |

### 2.2 වියදම් කළමනාකරණය

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ/ ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| පුනරාවර්තන වියදම් අයිතම පහක් යටතේ සම්පාදනය කරන ලද ප්‍රතිපාදනවලින් සියයට 10 සිට සියයට 35 දක්වා වූ ප්‍රතිපාදන අපේක්ෂිත කාර්යය සඳහා යොදා නොගෙන ඉතිරි කර තිබුණි. ඒ අනුව නිවැරදිව ඉදිරි | ඉදිරි වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තු සකස් කිරිමේදි මෙය සැලකිල්ලට ගෙන ඇස්තමේන්තු සකස් කිරිමට කටයුතු කරන බවට දන්වමි. | අයවැය සකස් කිරීමේදී පෙර වර්ෂ පිළිබඳව ද සලකා බලමින් නිවැරදිව ඉදිරි වියදම් පුරෝකථනය |

| | | |
|---|---|---|
| වියදම් පුරෝකථනය කරමින් අයවැය ලේඛනය සකස් කර නොමැති බව නිරීක්ෂණය විය. තවද පසුගිය වසර 04 සලකා බැලීමේ දී වැය විෂය අංක 270-1-0-2401 යටතේ සියයට 30 කට වඩා වැඩි මුදලක් ඉතිරි කර ගෙන ඇති අතර සමාලෝචන වර්ෂයේ ඇස්තමේන්තු සකස් කිරීමේදී එය සැලකිල්ලට නොගෙන ඇති බව නිරීක්ෂණය විය. | | කරමින් අයවැය ලේඛනය සකස් කිරීමට කටයුතු කළ යුතු වීම. |

**2.3 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ/ ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) කෘෂිකර්ම අමාත්‍යාංශය** | | |
| කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරන ලද පරිසර හිතකාමී පොහොර ප්‍රතිපත්තිය යටතේ 2022/ 23 මහ කන්නය වෙනුවෙන් අම්පාර දිස්ත්‍රික්කයේ ගොවීන් වෙත කාබනික පොහොර ලබාදීම වෙනුවෙන් රු.1,485,711,118 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණි. ඒ අනුව අම්පාර දිස්ත්‍රික් ලේකම්තුමාගේ සභාපතීත්වයෙන් සමන්විත පොහොර අනු කමිටුවේ තීරණය අනුව අම්පාර දිස්ත්‍රික් ජාතික පොහොර ලේකම් කාර්යාලය හා ගොවිජන සේවා දිස්ත්‍රික් කාර්යාලය ඒකාබද්ධව අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2022 දෙසැම්බර් 31 දිනට රු.893,415,900 ක වියදමක් දරමින් ගොවිජන සේවා මධ්‍යස්ථාන 29 ක ගොවීන් වෙත බෙදාදීම වෙනුවෙන් කාබනික පොහොර මිලදීගෙන තිබුණි. විගණන නියැදි පරීක්ෂණය අනුව පහත කරුණු නිරීක්ෂණය විය. | (i), (ii) පරිසර හිතකාමී කාබනික පොහොර ලබා දීමේ ව්‍යාපෘතිය සෘජුවම ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව හරහා ක්‍රියාත්මක වූ බැවින් ඔබගේ නිරීක්ෂණයන් පිළිබඳ පැහැදිලි කිරීම් මාගේ අංක FIN/CONT/AU.QUR/FC01/ 01 හා 2023.05.23 දිනැති ලිපිය මගින් ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස් වෙතින් කැඳවා ඇති අතර අදාල විස්තර ලද වහාම ඔබ වෙත වාර්තා කරන බව දන්වා සිටිමි. | වැය කරන ලද රාජ්‍ය වියදම සරිලන පරිදි සම්පත් උපයෝජනය කිරීමට කටයුතු කළ යුතු අතර ඒ සඳහා අදාළ මාර්ගෝපදේශ අනුව කටයුතු කළ යුතු වීම. |
| (i) ගොවීන් වෙත නිකුත් නොකරන ලද රු.8,577,405 ක වටිනාකමින් යුතු කාබනික පොහොර තොග ගොවිජන සේවා මධ්‍යස්ථාන තුනක ගබඩාවන්හි හා ගොවිජන සේවා මධ්‍යස්ථාන තුනකට අයත් ගොවි සංවිධාන ගබඩාවන්හි ගබඩාකර තිබුණි. ගොවීන් සමඟ සිදුකරන ලද සම්මුඛ සාකච්ඡාවන්හිදී ඔවුන් විසින් සිදුකරන ලද ප්‍රකාශ අනුව ගොවීන් විසින් මෙම පොහොර භාවිතයට අකමැති වීමත්, නිවැරදි කාල සීමාව තුළ පොහොර නොලැබීමත්, ලබාදුන් පොහොර නියමිත ප්‍රමිතියෙන් තොර වීමත් | | |

යනාදි කරුනු මෙලෙස පොහොර ඉතිරිවීමට හේතු වී ඇති බව නිරීක්ෂණය විය.

(ii) කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද පරිසර හිතකාමී පොහොර බෙදාහැරීම 2022/ 23 මහ කන්නය - මාර්ගෝපදේශයේ 3.8 වගන්තිය අනුව 2022 යල කන්නයේ ඉතිරි වී ඇති කාබනික පොහොර කෘෂිකර්ම අමාත්‍යාංශයේ විශේෂ අනුමැතිය යටතේ 2022/ 23 මහ කන්නය වෙනුවෙන් ගොවීන් වෙත ලබාදිය හැකි වුවද ගොවිජන සේවා මධ්‍යස්ථාන 02 ක් තුළ එලෙස 2022 යල කන්නයේ දී ඉතිරි වී ඇති රු.68,686,000 ක් වටිනා කාබනික පොහොර තොගය 2022/ 23 මහ කන්නයේ බෙදා දීමට කටයුතු නොකිරීම හේතුවෙන් 2022/ 23 මහ කන්නයේ දී කාබනික පොහොර මිලදී ගැනීමේ රාජ්‍ය වියදමින් රු.68,686,000 ක් ඉතිරිකර ගත හැකිව තිබූ අවස්ථාව අහිමි වී තිබුණි.

**(ආ) කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්වීමේ අමාත්‍යාංශය**

| | | |
|---|---|---|
| කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්වීමේ අමාත්‍යාංශය යටතේ පවතින ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය මඟින් අඩු ආදායම්ලාභී වැන්දඹු හා ගෘහ මූලික කාන්තාවන්ගේ ආර්ථික තත්ත්වය නඟා සිටුවීම සඳහා අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 06 ක් තුළ 2010 සිට 2022 කාලපරිච්ඡේදය තුළ ක්‍රියාත්මක කරන ලද ණය ව්‍යාපෘති 05 කට අදාළව රු.1,208,212 ක් අය කර ගත යුතුව පැවතුණි. | මේ සම්බන්ධව අදාළ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස මඟින් කරුණු විමසීමේ දී විවිධ වූ කරුණු මත මෙම ණය අයකර ගැනීමට ප්‍රමාද වූ බවත් මේ වන විට අදාල නිලධාරින් දැනුවත් කර එම ණය ශේෂයන් අයකර ගැනීමට කටයුතු සිදුකරන බවත් වාර්තා කරමි. | හිඟ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

**(ඇ) ග්‍රාමීය ආර්ථික බෝග වගා හා ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය ලැබීම්**

| | | |
|---|---|---|
| (i) ග්‍රාමීය ආර්ථික බෝග වගා හා ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය යටතේ අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මඟින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සඳහා තොරාගත් ප්‍රතිලාභීන් අදියර දෙකක් යටතේ එළවන් ඇති කිරීමේ ව්‍යාපෘතිය රු.6,197,323 ක වියදමින් | තාක්ෂණික ඇගයීම් කමිටු හා ප්‍රසම්පාදන කමිටු තීරණය අනුව සතුන් රක්ෂණය කිරිම ප්‍රතිලාභීන් මගින් සිදුකර ගත යුතුය. ව්‍යාපෘතිය සඳහා ප්‍රතිලාභීන් තේරීම හා පසු අධීක්ෂණ කටයුතු සත්ත්ව | ව්‍යාපෘති ඉටු කිරීමේ දී අදාළ සියලු ප්‍රතිලාභීන් හට අපේක්ෂිත ප්‍රතිලාභ ලැබෙන පරිදි ක්‍රියාත්මක කිරීමටත් ඉටුකරන ලද |

| | | |
|---|---|---|
| ක්‍රියාත්මක කර තිබුණි. විගණන නියැදි පරීක්ෂණය අනුව එලෙස ලබා දුන් එළුවන් අතරින් පළමු අදියර යටතේ රු.194,000 ක් වටිනා එළුවන් 09 දෙනෙකු ද දෙවන අදියර යටතේ රු.215,115 ක් වටිනා එළුවන් 09 දෙනෙකු ද වශයෙන් රු.409,115 ක වටිනාකමකින් යුතු එළුවන් මිය ගොස් තිබුණි. මිය ගොස් තිබුණු එළුවන් නියමිත බරින් යුක්ත නොවීමත්, අදාළ චක්‍රලේඛය අනුව ප්‍රතිලාභීන් වෙත එළුවන් ඇති කිරීම සඳහා වූ පුහුණුවක් ලබා නොදීමත්, ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා අදාළ ආයතන මට්ටමින් මෙම ව්‍යාපෘතිය සම්බන්ධව අධීක්ෂණය දුර්වල වීමත් මේ සඳහා හේතු වී ඇති බවත් නිරීක්ෂණය වූ අතර ප්‍රතිලාභීන් හට ලබා දී තිබුණු එළුවන් සඳහා රක්ෂණාවරණ ලබාගෙන නොමැති වීමද හේතුවෙන් එම මියගිය එළුවන් වෙනුවෙන් අදාල ප්‍රතිලාභීන් හට වෙනත් විකල්ප ප්‍රතිලාභයක් හෝ නොලැබී ඇති බැවින් ව්‍යාපෘතියේ අරමුණු ඉටු වී නොමැති බව නිරීක්ෂණය විය. | නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට පැවරී තිබූ අතර ප්‍රතිලාභීන් ලවා රක්ෂණය සිදු කරවන ලෙස එම දෙපාර්තමේන්තුව දැනුවත් කර ඇත. තවද සතුන් මිලදී ගැනීමට පෙර පශු වෛද්‍ය වරුන්ගෙන් සමන්විත කමිටුවක් විසින් සෞඛ්‍ය තත්ත්වය පරීක්ෂා කර ලබා දී ඇති අතර, පසුගිය වසරේ නොවැම්බර් හා දෙසැම්බර් මස ඇති වූ කාලගුණික තත්ත්වයන් මත නැගෙනහිර පළාතේ එළුවන් හා ගවයින් මිය යාම සිදු වී ඇති බව වාර්තා කරමි. | ව්‍යාපෘති සම්බන්ධව පසුවිපරමක් සිදුකළ යුතු වීම. |
| (ii) ග්‍රාමීය ආර්ථික බෝග වගා හා ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මඟින් ක්‍රියාත්මක කරන ලද ග්‍රාමීය ආර්ථික බෝග වගා වැඩසටහනේ උඳු/ මුං බෝග වගා ව්‍යාපෘතියට (BG - Black Gram/GG - Green Gram - 2022) අදාලව අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 14 ක් තුළ ප්‍රතිලාභීන් 1073 දෙනෙකු වෙත රු.6,195,575 ක වටිනාකමින් යුතු මුං ඇට බීජ කි.ග්‍රෑ. 5926.5 ක් බෙදා දී තිබුණි. විගණන නියැදි පරීක්ෂණය අනුව මෙම මුං බීජ 2022 වර්ෂයේ ජූලි හා අගෝස්තු මාසයන්ගෙන් ආරම්භ වන තුන්වන කාර්තුව සඳහා වගා කිරීමට අපේක්ෂා කළ ද අදාල බීජ ගොවීන් වෙත ලබා දී තිබුණේ 2022 දෙසැම්බර් මස වන බැවින් මෙම ව්‍යාපෘතිය මඟින් අපේක්ෂිත කාලය තුළ ගොවීන් වෙත ප්‍රතිලාභ ලැබී නොමැති බව නිරීක්ෂණය විය. | මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සම්බන්ධව දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ දැනුවත් වන විට අම්පාර දිස්ත්‍රික්කයේ 2022 යල කන්නයේ වගා කටයුතු සිදු කර තිබීමත්, සැප්තැම්බර් හා දෙසැම්බර් කාල සීමාව තුළ වර්ෂාව පැවතීමත්, එම වැඩසටහනට නිලධාරීන් ද සම්බන්ධ කර ගැනීමට අපහසු වීමත් යනාදී හේතූන් මත අපේක්ෂිත කාලය තුළ ප්‍රතිලාභ නොලැබී ඇති බව වාර්තා කරන අතර කෙසේ වෙතත් අදාළ බීජ ප්‍රතිලාභීන් වෙත නිකුත් කර ඇති බවත් වැඩි දුරටත් දන්වමි. | ව්‍යාපෘති අපේක්ෂිත කාලය තුළ ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු වීම. |

**(ඇ) සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව**

| | | |
|---|---|---|
| සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක කරන ලද සමෘද්ධි පවුල් ලක්ෂ දෙකක් (200,000) කේන්ද්‍ර කරගත් අංග සම්පූර්ණ ගෘහ නේවාසික ආර්ථිකයක් සංවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ 2021 වර්ෂය සඳහා සමෘද්ධි ප්‍රතිලාභීන් වෙත කුකුළු පැටවුන් ලබාදීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් රු.1,840,680 ක් වියදම් කර තිබුණි. ඒ අනුව නැගෙනහිර පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් 2022 නොවැම්බර් 16 දින සහ 2023 ජනවාරි 31 යන දිනයන්හි දී කුකුල් පැටවුන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ලබා දී තිබුණි. කෙසේ නමුත් කුකුල් පැටවුන් ලබා දී මාස 03 ක කාලයක් තුළ රු.822,420 ක වටිනාකමින් යුතු කුකුල් පැටවුන් 942 ක ප්‍රමාණයක් මියගොස් තිබුණි. එම මියගිය කුකුල් පැටවුන් වෙනුවෙන් විගණන දිනය වන විටත් වෙනත් කුකුල් පැටවුන් ලබාදීමක් සිදු නොවීම හේතුවෙන් ව්‍යාපෘතිය වෙනුවෙන් වියදම් කරන ලද රු.822,420 කට ආසන්න මුදලක ප්‍රතිලාභ අදාළ සමෘද්ධි ප්‍රතිලාභීන් හට නොලැබී ඇති බව නිරීක්ෂණය විය. | 2022/11/16 වන දින පළමු වටයේදි ලබා ගත් කුකුළු පැටවුන්ගෙන් පැටවු 510 දෙනෙකු මිය ගොස් ඇත. ඒ බව නැගෙනහිර පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමෙන්තුවේ පළාත් අධ්‍යක්ෂක වෙත ලිඛිතව දන්වා ඇත. නමුත් විගණිත දිනය වන විටත් සාධනිය ප්‍රතිචාරයක් නොලැබී ඇති බැවින් ඒ සම්බන්ධයෙන් ඉදිරියේදී කටයුතු කරන බව දන්වා සිටිමි. | ව්‍යාපෘති ඉටු කිරීමේ දී අදාළ සියලු ප්‍රතිලාභීන් හට අපේක්ෂිත ප්‍රතිලාභ ලැබෙන පරිදි ක්‍රියාත්මක කිරීමටත් ඉටුකරන ලද ව්‍යාපෘති සම්බන්ධව පසුවිපරමක් සිදුකළ යුතු වීම. |

## 2.4 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්**,** ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ/ ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි | අභ්‍යන්තර පාලනයේ එක් කොටසක් ලෙස අප කාර්යාලයේ අභ්‍යන්තර විගණන ඒකකයක් ක්‍රියාත්මක වෙමින් පවතී. එහිදි වාර්ෂික විගණන සැලැස්මක් සකස් කර ඒ අනුව සකස් කරන ලද විගණන වැඩසටහන්වලට අනුව මෙහෙයුම් කටයුතු සිදුකරන බවත් එහි පිටපත් විගණකාධිපති වෙත යවනු | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන අනුව කටයුතු කළ යුතු වීම. |

| | |
|---|---|
| පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | ලබන බවත් වාර්තා කරමි. |

## 2.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නිරීක්ෂණය | | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ/ ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | **නීති, රීති හා රෙගුලාසි වලට යොමුව** | **වටිනාකම** <br> **රු.** | **අනුකූල නොවීම** | | |
| (අ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | | | | |
| (i) | XIX පරිච්ඡේදයේ 5 සහ 5:1 වගන්ති | 437,475 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් රජයේ නිවාස 06 ක පදිංචිව සිටින පදිංචිකරුවන්ගෙන් හිඟ කුලී අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි. | නිවාස 2කට අදාළව කුළිය ගෙවමින් පවතින අතර නිවාස 4කට අදාළව හිඟ කුලී අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. | ආයතන සංග්‍රහය අනුව හිඟ කුලී අයකර ගැනීමට පියවර ගත යුතු වීම. |
| (ii) | XXIV පරිච්ඡේදයේ 4 වගන්ති | 1,687,862 | රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශය අනුව, සේවය අත්හිටවූ, සේවය අත්හැරගිය, මියගිය සහ විශ්‍රාම ගිය නිලධාරීන් 14 දෙනෙකුගෙන් සමාලෝචිත වර්ෂයේ අවසාන දින වන විටත් මාස 03 සිට වර්ෂ 03ක කාල පරාසයක සිට හිඟ ණය අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි. | නිලධාරීන්ගෙන් 5 දෙනෙකුට අදාළව රු.351,270 මුදලක් මේ වන විට නිරවුල් කර ඇති අතර නිලධාරීන්ගේ 9 දෙනෙකුට අදාළව රු.1,687,862 මුදලක් අයකර ගැනීමට කටයුතු කරමින් ඇත. | ආයතන සංග්‍රහය අනුව හිඟ ණය අයකර ගැනීමට පියවර ගත යුතු වීම. |

(ආ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ

| | | | | |
|---|---|---|---|---|
| රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ 2009 අප්‍රේල් 16 දිනැති හා අංක 2009/09 චක්‍රලේඛයේ 2.iv වගන්තිය | 5,191,174 | වේලාව පදනම් කරගනිමින් අතිකාල හා නිවාඩු දින වැටුප් ආදී නිත්‍ය රාජකාරී වේලාවෙන් පසුව ගෙවනු ලබන දීමනා සඳහා කාලය පදනම් කරගන්නේ නම්, එම කාලය ඇඟිලි සලකුණු යන්ත්‍රය මඟින් සනාථ කළ යුතු වුවද මහඔය, අම්පාර හා පොතුවිල් ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් 2022 වර්ෂය සඳහා එලෙස ඇඟිලි සලකුණු යන්ත්‍රය භාවිතා කිරීමකින් තොරව නිලධාරීන් 141 දෙනෙකු වෙත අතිකාල හා නිවාඩු දින දීමනා ගෙවීම් කර තිබුණි. | මේ වන විට ඇඟිලි සලකුණු යන්ත්‍රය භාවිතා කරමින් අදාළ ගෙවීම් සිදුකර ගෙන යනු ලබයි. | චක්‍රලේඛයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතු වීම. |

## 2.6 තැන්පත් ශේෂයන්

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ/ ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තැන්පත් කර වසර 02 ක් ඉක්මවා ඇති රු.11,944,076 ක වටිනා තැන්පතු වර්ග 02ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | වසර දෙකක් ඉක්මවා ඇති මෙම තැන්පතු සම්බන්ධයෙන් මෙම වර්ෂය තුලදී මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු සිදුකිරිමට පියවර ගන්නා බව දන්වා සිටිමි. | මුදල් රෙගුලාසි 571(2) අනුව කටයුතු කළ යුතු වීම. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 සැලැසුම් කිරීම

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ/ ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතු අතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් එසේ කටයුතු කර නොතිබුණි. | 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 රාජ්‍ය මුදල් චක්‍රෙල්ඛය අනුව ඉදිරියේදි ක්‍රියාකාරි සැලැස්මක් සකස් කිරිමට කටයුතු සිදුකරමින් පවතින බව වාර්තා කරමි. | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අනුව කටයුතු කළ යුතු වීම. |

### 3.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ/ ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පදියතලාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ගම සමඟ පිළිසඳර වැඩසටහන - 2022 යටතේ හෙළකෝමාන කොරමදයාලන්ද මාර්ගය, සුමනසාර විදුහල් මාර්ගය හා පළතුරුවැල්ල කපුදෙනියගල මාර්ගය යන මාර්ග 3ක් කොන්ක්‍රීට් කිරීම වෙනුවෙන් එකතුව රු.1,747,571 ක වියදමක් දරා තිබුණි. එම මාර්ග 3 කොන්ක්‍රීට් කිරීම අදාලව ඇස්තමේන්තුවන්හි අයිතම අංක 07 අනුව අදාල මාර්ග මතුපිට තාර යෙදිය යුතු වුවද කොන්ත්‍රාත්තුව ලබාගත් ප්‍රජා මණ්ඩල විසින් අදාල කාර්යය ඉටු නොකිරීම මත ඒ සඳහා වෙන් කරන ලද රු. 65,520 ක මුදල තැන්පතු ගිණුම තුළ රඳවා තිබුණද 2023 මාර්තු 31 දින වන විටත් අදාල කාර්යය ඉටුකරවා ගෙන නොතිබුණි. | අදාළ කොන්ත්‍රාත්කරු වාචිකව දැනුවත් කර ඇති අතර ඔහු විසින් රැඳවුම් මුදල් ලබා ගැනීමට පෙර කඩිනමින් එම වැඩ කොටස් නිම කරන බවත් දන්වන ලදී. ඒ අනුව එම වැඩ කොටස් නිම කිරිමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව දන්වා සිටිමි. | ව්‍යාපෘතිය සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදන මුදලට යටතේ අපේක්ෂිත නිමවුම මට්ටම ලබා ගැනීමට කටයුතු කළ යුතු වීම. |

### 3.3 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ/ ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය 2016 (RIDP) යටතේ පදියතලාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් මොරදෙණිය ග්‍රාම නිලධාරි වසමේ ජල ව්‍යාපෘතිය සඳහා නළ ලිදක් ඉදිකිරීමට රු.1,000,000 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණි. ඒ අනුව මෙම ව්‍යාපෘතිය ඉටුකර ගැනීම සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය වෙත 2016 වර්ෂයේ දී රු.944,233 මුදලක් ගෙවීම් කර තිබුණි. කෙසේ වෙතත් මෙම ව්‍යාපෘතිය අසාර්ථක වීම හේතුවෙන් 2021 ඔක්තෝබර් මස 31 වන දින ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය මගින් ලබාගන්නා ලද මුදලින් ඔවුන් විසින් දරන ලද වියදම් අයකර ගනිමින් රු.510,250 ක මුදලක් නැවත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ගෙවීම් කර තිබුණු අතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් එම මුදල තැන්පත් ගිණුමෙහි රඳවා තිබුණි. ඒ අනුව ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන ලැබී වසර 07 ක කාල සීමාවක් තිබුණු අතර ව්‍යාපෘතිය අත්හැර දමා ඇති බවත් මෙම කාර්යය වෙනුවෙන් වැයකරන ලද රු.433,983 ක මුදල නිෂ්කාර්ය වියදමක් බවත් නිරීක්ෂණය විය. | මෙම මුදල ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය ලබා දුන් පසු ඔවුන්ගේ යන්ත්‍රයක් අක්‍රීය වීම නිසා ප්‍රමාද වන බවත් එය පිළිසකර කර ගත් වහාම නිම කර දෙන බවටත් අප වෙත දැනුම් දී ඇත. | ව්‍යාපෘති නියමිත කාලය තුළ සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ආ) | නැගෙනහිර පළාත් කෘෂිකර්ම, වාරිමාර්ග, සත්ව නිෂ්පාදන හා ධීවර, සමූපකාර සංවර්ධන, ආහාර සැපයුම් හා බෙදා හැරීම් අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කරන ලද තිරසාර සාම්ප්‍රදායික කාබනික සංවර්ධන වැඩ සටහන යටතේ දමන හා උහන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන්හි මහා පරිමාණ කාබනික පොහොර නිෂ්පාදනය වෙනුවෙන් 2021 වර්ෂය තුළ ප්‍රතිලාභීන් තිදෙනෙකු සඳහා රු.1,500,000 ක ප්‍රතිපාදන නිදහස් කර තිබුණ ද 2023 මාර්තු 31 වන විටත් අදාළ ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් ප්‍රතිපාදන මුදල තැන්පතු ගිණුමට ඇතුළත් කර තිබුණි. | දමන කොට්ඨාශයේ අදාළ ප්‍රතිලාභියා වෙනුවෙන් වෙනත් ප්‍රතිලාභියෙකු තෝරා ගැනීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙන් අනුමැතිය ඉල්ලා ඇතත් ඒ සඳහා අනුමැතිය නොලැබීම හේතුවෙන් රු.500,000 ක මුදලක් ද උහන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේද තෝරාගත් ප්‍රතිලාභීන් ව්‍යාපෘතිය කිරීමට එකඟ නොවීම හේතුවෙන් රු.1,000,000 ක මුදලක් ද තැන්පත් ගිණුමෙහි පවතින අතර මුදල් වියදම් නොවී පවතින බව දන්වා ඇත. | ව්‍යාපෘතියට අදාළ ප්‍රතිපාදන මුදල සම්පූර්ණයෙන් උපයෝජනය වන පරිදි නියමිත කාලය තුළ ව්‍යාපෘති සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතු වීම. |

| | | |
|---|---|---|
| | ඉදිරියේදි එම ඉතිරි මුදල් නැගෙනහිර පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය වෙත යොමු කිරිමට කටයුතු සූදානම් කර ඇති බව දන්වා සිටිමි. | |

## 3.4 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ/ ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද 2021 දෙසැම්බර් 15 වන දිනැති හා අංක MF/NPD 02/2021 දරන ගම සමහ පිළිසඳරක් - 2022 චක්‍රලේඛයේ 3.3 වගන්තිය අනුව සියලුම ව්‍යාපෘති යෝජනා වර්ෂය තුළ ක්‍රියාත්මක කර අවසන් කළ යුතු වුවද පදියතලාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය යටතේ ව්‍යාපෘති 42 කට අදාළ ප්‍රතිලාභීන් 190 දෙනෙකු වෙත බෙදා දිය යුතු රු.6,558,253 ක වටිනාකමකින් යුතු භාණ්ඩ බෙදා නොහැර 2023 අප්‍රේල් 04 දින වන විටත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය තුළ ගබඩා කර තිබුණු අතර දමන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය යටතේ ක්‍රියාත්මක කරන ලද රු. 270,000 ක් වටිනා ව්‍යාපෘති දෙකක් අවසන් කර නොතිබුණි. | මෙම භාණ්ඩ බෙදා දීමට කටයුතු සූදානම් කර තිබූ අතර පළාත් පාලන මැතිවරණය ප්‍රකාශයට පත් කිරීම නිසා එය නවතා දැමීමට සිදු වු බවත්, මැතිවරණය කල් ගියද මැතිවරණය අවලංගු කර නොමැති බැවින් මෙම භාණ්ඩ බෙදා දීම සිදු කිරීමට නොහැකි වූ බවත් අදාල ප්‍රාදේශිය ලේකම් වරයා විසින් වාර්තා කර ඇත. මෙම භාණ්ඩ බෙදා දීමට අනුමැතිය හා උපදෙස් ලබා ගැනීමට සහකාර මැතිවරණ කොමසාරිස්ගේ විමසීමක් සිදු කර ඇති අතර පිළිතුරු ලැබුණු පසු ඒ අනුව කටයුතු කරන බව දන්වා සිටිමි. | අදාළ කාල සීමාව ව්‍යාපෘති ක්‍රියාත්මක කර අවසන් කළ යුතු වීම. |

## 3.5 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ/ ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් වාහනයක් පසුගිය වර්ෂ 21කට අධික කාලයක සිට අලුත්වැඩියා සිදුකිරීම සඳහා ගරාජයකට භාරදී තිබුණත්, එය අලුත්වැඩියා කිරීමට හෝ ආපසු ලබා ගැනීමට සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් පියවර ගෙන නොතිබුණි. | මෙම කාර්යාලයට අයත් ලොරි රථය වසර 21ක කාලයක් ගරාජයේ නවතා තිබූ අතර**,** එම වාහනයේ අයිතිය එවකට පුනරුත්ථාපන දෙපාර්තමේන්තුවට අයත් නිසා අයිතිය දිස්ත්‍රික් ලේකම් නමින් හරවා ගැනීම සඳහා අවශ්‍ය | භාවිතයට ගත නොහැකි රථවාහන කඩිනමින් අපහරණය කිරීමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | | ලියකියවිලි භාණ්ඩාගාර කොම්ප්‍රෝලර් ජනරාල් වෙත භාර දී ඇත. එම ලොරි රථය දිරාපත් වී ඇති හෙයින් ඇදගෙන ඒමට අපහසු වීම හා වෙනත් රථයකට පටවා ගෙන ඒමේ දී ද විශාල වියදමක් දැරීමට සිදුවන බැවින් ලොරි රථය එම ස්ථානයේදීම වෙන්දේසි කිරීමට කටයුතු සිදු කරන බවත් කාරුණිකව දන්වා සිටිමි. | |
| (ආ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2019 වර්ෂයේ සිට 2023 මැයි මාසය දක්වා යතුරු පැදි 28 ක් ධාවනයට යොදා නොගැනීම හේතුවෙන් වර්ෂ 03කට අධික කාලයක සිට ගබඩා සංකීර්ණයේ නවතා තබා තිබුණි. | 2022 වර්ෂයේ නිලධාරීන්ගේ ඉල්ලීම මත ධාවනයට සුදුසු යතුරු පැදි 10ක් ලබා දී ඇති අතර, ධාවනයට නුසුදුසු යතුරු 05ක් හාඩි තාක්ෂණ ආයතයේ ළමුන්ගේ අධ්‍යාපන කටයුතු සඳහා (Automobile Course) ලබා දී ඇත. තවද, ඉදිරියේ දී කිසියම් රාජ්‍ය ආයතනයකින් හෝ නිලධාරියෙකුගෙන් ඉල්ලීමක් ලැබුණහොත් සුදුසු තත්ත්වයේ පවතින යතුරු පැදි කාර්යාලයේ ප්‍රයෝජනය සඳහා ලබා දීමට කටයුතු කරමි. | මෙම යතුරු පැදි අලුත්වැඩියා කර භාවිතා කිරීමට හෝ අපහරණය කිරීමට හෝ වෙනත් අවශ්‍ය ක්‍රියාමාර්ගයන් කඩිනමින් ගත යුතු වීම. |
| (ඇ) | සමාජ සේවා දෙපාර්තමේන්තුව විසින් මහඔය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ලබා දී තිබුණු වතුර බවුසරය 2013 වර්ෂයේ සිට වසර 10 ක පමණ කාල සීමාවක් භාවිතයට ගැනීමකින් තොරව ප්‍රාදේශීය ලේකම් කාර්යාල භූමියේ ගාල්කර ඇති අතර 2023 පෙබරවාරි 17 දින වන විටත් එම වාහනය අලුත්වැඩියා කර භාවිතයට ගැනීමට හෝ එසේ නොමැති නම් අපහරණය කිරීමට හෝ වෙනත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | බවුසරය අලුත්වැඩියාව සඳහා මීට වසර ගණනාවකට පෙර ඉල්ලුම් කර ඇත අතර, එම මුදල් නොලැබීම හේතුවෙන් මේ වන විට අලුත් වැඩියා කටයුතු සඳහා විශාල මුදලක් දැරීමට සිදුවීමත් හේතුවෙන් අලුත්වැඩියාව සිදු නොකරන ලදී. අපහරණ කටයුතු සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මඟින් මේ වන විටත් සිදු කරමින් පවතී. | මෙම වාහනය අපහරණය කිරීමට හෝ වෙනත් අවශ්‍ය ක්‍රියාමාර්ගයන් කඩිනමින් ගත යුතු වීම. |
| (ඈ) | මහඔය ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ පැවති රාජ්‍ය නොවන සංවිධානයක් මඟින් ස්වේච්ඡා සංවිධානයක් වෙත ලබා දී තිබූ සංයුක්ත කොළ මඩින යන්ත්‍ර දෙකක්, ට්‍රැක්ටරයක් හා ටේලරයක් එම ස්වේච්ඡා සංවිධානයේ ආරවුලක් හේතුවෙන් 2012 වර්ෂයේ මහඔය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ලබා දී තිබුණ ද 2023 පෙබරවාරි 17 දින වන විටත් ඒ සම්බන්ධ කිසිදු පියවරක් ගෙන නොතිබුණු අතර අදාල වාහන මේ වන විට භාවිතයට ගත නොහැකි තත්ත්වයේ පවතින බව නිරීක්ෂණය විය. | මෙම කොට්ඨාශයේ රාජ්‍ය නොවන සංවිධානයන් මඟින් ස්වේච්ඡා සංවිධානයක් වෙත ලබා දී ඇති සංයුක්ත කොළ මඩින යන්ත්‍ර දෙක, ට්‍රැක්ටරය හා ටේලරය මෙම කාර්යාලය වෙත භාර දී ඇත. එම යන්ත්‍ර පිළිබඳ ඉදිරි කටයුතු විගණන කළමනාකරණ කමිටු තීරණ අනුව සිදු කරමි. | අදාළ ස්වේච්ඡා සංවිධානය සමඟ සාකච්ඡා කර අපහරණය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වීම. |

## 3.6 පාඩු හා හානි

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ/ ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් සද්ධාතිස්සපුර ගබඩාව 2015 සැප්තැම්බර් 21 දින සොරුන් විසින් කඩා සිදු වූ පාඩුව රු.850,738 ක් ලෙස තක්සේරු කර තිබුණත්, 2023 මැයි 09 දින වන විටත් ඉදිරි පියවර ගෙන නොතිබුණි. | මේ පිළිබඳව අතිරේක දිස්ත්‍රික් ලේකම්ගේ ප්‍රධානත්වයෙන් යුතු කමිටුවක් පත්කර ඇති අතර එහි විමර්ශන කටයුතු මේ වන විට සිදු වෙමින් පවතින බවත් කමිටු වාර්තාව ලද වහාම ඒ අනුව ඉදිරි පියවර ගනු ලබන බවත් දන්වා සිටිමි. | සිදු වී ඇති පාඩුවට වගකිව යුතු පාර්ශවයකින් අය කිරීමට හෝ වෙනත් අදාළ ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතු වීම. |

## 3.7 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ/ ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මහඔය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ලබා දී ඇති කැබ් රථය 2020 අගෝස්තු මස 14 වන දින අනතුරට පත්වී තිබුණි. අනතුර හේතුවෙන් රථය අලුත්වැඩියා කිරීමට දරන ලද වියදම රු.1,286,062 ක් වන අතර රක්ෂණ ආයතනය විසින් ගෙවන ලද මුදල රු.552,543 කි. මුදල් රෙගුලාසි 104 (4) ප්‍රකාරව ඉදිරිපත් කර ඇති අවසන් වාර්තාව අනුව රක්ෂණ ආයතනය විසින් ආවරණය නොවන අලාභය වාහනයේ රියදුරුගෙන් අයකර ගැනීමට නිර්දේශ කර තිබුණ ද වාහනය අලුත්වැඩියාව වෙනුවෙන් දරන ලද රක්ෂණ ආයතනය මගින් අයකර ගත නොහැකි වූ මුදල වන රු.773,517 ක් අම්පාර දිසත්‍රික් ලේකම් කාර්යාලය විසින් ගෙවීම් කර 2023 මාර්තු 25 දින අදාළ වාහනය ගරාජයෙන් නැවත ලබාගෙන තිබුණ ද 2023 මැයි 01 දින විටත් රජයේ මුදලින් දරන ලද අලාභය අදාළ රියදුරුගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | කැබ් රථය සඳහා ලබා දෙන රක්ෂණ වාරික මේ වන විට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට ලබා දී ඇති අතර, රක්ෂණාවරණයෙන් ආවරණය නොවන මුදල රියදුරුගෙන් අයකර ගැනීමට යටත්ව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙන් අදාල මුදල ගෙවා කැබ් රථය නිදහස් කර ගැනීමට කටයුතු කර ඇත. රක්ෂණාවරණයෙන් ආවරණය නොවන මුදල රියදුරු විසින් රු.5,000 බැගින් මාසිකව ගෙවීමට ඉල්ලීම් කර ඇති අතර, ඒ පිළිබඳ උපදෙස් පතා රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම් වෙත ලිපියක් යොමුකර ඇතත් මේ වන තෙක් නිසි පිළිතුරක් ලැබී නොමැත. | රජයට සිදු වී ඇති අලාභය වගකිවයුතු නිලධාරින්ගෙන් අයකර ගැනීමට කඩිනමින් පියවර ගත යුතු වීම. |

## 4. යහපාලනය

### 4.1 මහජනයා වෙත සේවා ඉටු කිරිම

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ/ ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ 2018 ජනවාරි 24 දිනැති අංක 05/2018(1) දරන චක්‍රලේඛයෙන් සංශෝධිත 2008 පෙබරවාරි 06 දිනැති අංක 05/2008 දරන චක්‍රලේඛයෙන් හඳුන්වා දී ඇති පරිදි පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය පිළියෙල කර ක්‍රියාත්මක කළ යුතු වුවද අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ඒ අනුව කටයුතු කර නොතිබුණි. | 2008 පෙබරවාරි 06 දිනැති අංක 05 /2008 දරණ චක්‍රලේඛයෙන් හඳුන්වා දී ඇති පුරවැසි/ සේවාලාභි ප්‍රඥප්තිය මේ වන විට සකස් කරමින් පවතින අතර ඉදිරියේ දී එය සාර්ථකව ක්‍රියාත්මක කිරීමට කටයුතු යොදන බවට දන්වා සිටිමි. | චක්‍රලේඛයෙන් හඳුන්වා දී ඇති පරිදි පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය පිළියෙල කර ක්‍රියාත්මක කළ යුතු වීම. |

## 5. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ/ ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | **අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය** | | |
| (අ) | 2022 දෙසැම්බර් 31 දිනට අනුමත සේවක සංඛ්‍යාව 2363 ක් ද, තථ්‍ය සේවක සංඛ්‍යාව 2721 ක් ද වූ අතර කාර්ය මණ්ඩලයේ පවතින පුරප්පාඩු 116 ක් පුරවා ගැනීමට හා 474 දෙනෙකුගෙන් යුතු අතිරික්ත කාර්ය මණ්ඩලය විධිමත් පරිදි අනුමත කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අමාත්‍යාංශ මට්ටමින් බවා ගත් නිලධාරින් මෙම දිස්ත්‍රික්කයට අනුයුක්ත කිරීම හේතුවෙන් පෙන්වා ඇති අනුමත සීමාව ඉක්මවා ඇති බව වාර්තා කරන අතර අදාල අනුමැතිය ලබා ගැනීමේ කටයුතු ඉදිරියේදි සිදුකරන බව දන්වමි. | පවතින පුරප්පාඩු පුරවා ගැනීමට හා අතිරික්ත කාර්ය මණ්ඩලය විධිමත් පරිදි අනුමත කර ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ආ) | රාජ්‍ය පරිපාලන ලේකම්ගේ අංක 02/2018 හා 2018 ජනවාරි 24 දිනැති චක්‍රලේඛයේ විධිවිධාන අනුව මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. තවද සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම ඉහත චක්‍රලේඛය අනුව වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කර නොතිබුණි. | මේ වන විට මානව සම්පත් සැලැස්මක සකස් කිරිමේ කටයුතු සිදුවෙමින් පවතින බව දන්වා සිටිමි. | චක්‍රලේඛය අනුව මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2001 අගෝස්තු 22 දිනැති අංක 18/2001 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අනුව, උපරිම සේවා කාලය සෑම සේවා ස්ථානයකම වර්ෂ 05ක් සේවය කර ඇති සෑම නිලධාරියෙකුම වෙනත් සේවා ස්ථානවල සේවය කිරීමට ඉඩ සැලැසීම සඳහා ස්ථාන මාරු ලබාදිය යුතු බව සඳහන් වුවත්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සේවයේ නියුතු නිලධාරීන් 27 දෙනෙක් වර්ෂ 06 සිට 12 දක්වා කාලයක් එකම සේවා ස්ථානයක නියුතුව සිටියත් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් වෙනත් සේවා ස්ථාන වෙත ස්ථාන මාරු කිරීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | 2022 වර්ෂයේ ස්ථාන මාරු සිදු කිරිමේදි ව අවුරුදු 05 ඉක්ම වූ නිලධාරින් හට ප්‍රමුඛතාවය ලබා දුන් අකර ඉදිරි වර්ෂ වලදි ස්ථාන මාරු වීම් ලබා දීමේදි වැඩිම කාලයක් සේවය කර ඇති නිලධාරින් ස්ථාන මාරු කිරිමට කටයුතු කර, ක්‍රමානුකූලව අවුරුදු 05 ට වැඩි සේවා කාලයක් ඇති නිලධාරීන් පරිපාලනමය ගැටළු මතු නොවන ආකාරයෙන් ස්ථාන මාරු කිරිමට කටයුතු යොදන බව දන්වා සිටිමි. | චක්‍රලේඛය අනුව නියමිත කාලය තුළ ස්ථාන මාරු ලබා දීමට කටයුතු කළ යුතු වීම. |